# ඉදුණු අඹ ගෙඩිය...



ඒ. එම්. මලීෂා විහංගි අලහකෝන්

කෘතියේ නම

# ඉදුණු අඹ ගෙඩිය

කතෘගේ නම

## ඒ. එම්. මලීෂා විහංගි අලහකෝන්

සියලුම හිමිකම් ඇවිරිණි

**කතෘගේ වෙනත් කෘති**

පළමු දිගහැරුම

මහනුවර මහාමායා බාලිකා විදුහල

1 ශ්‍රේණිය B

2026 මැයි 10

# පිදුම....

මහාමායා  විදූ මව් පියසට පා තබා...

මාස 03ක් වැනි කෙටි කාලයක් තුළ...

මෙම ග්‍රන්ථය රචනා කිරීමට...

මා හට ගුරු හරුකම් ලබා දුන්...

ආදරණීය ගුරු මෑණියනි...

**"වාමිනී පල්ලියගුරු"** මැතිණියනි...

ඔබ තුමියටයි...

මාගේ මේ කුළුඳුල් ග්‍රන්ථයේ...

බැතිබර පිදුම...

# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදු කරන **"හේමමාලා උපහාර"** ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු

කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන්, මඟ පෙන්වූ ගුරු භවතන් ඇතුළු සැමට ස්තූතිය පුද කරමි.


විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත

සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.

සම්මානිත මහාචාර්යය

2026.05.10

## සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා භාරිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත්

එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල.
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව.
2026.05.10

# ඉදුණු අඹ ගෙඩිය...

එක දවසක් ඉස්කෝලෙ ඇරිලා මම පාර දිගේ තනියම ගෙදර ආවා. ඒ එන අතර මග ලොකු අඹ ගහක් තිබුණා. මම දැක්කා ඉදුණු අඹ



ගෙඩියක් පාර අයිනෙ වැටිලා තියෙනවා. මම වට පිට බලලා ඒක හෙමින් අහුලා ගත්තා. අනේ ඒක එක පැත්තකින් සතෙක් කාලා. මට දුක හිතුණා. මම ඒ සතා කාපු පැත්ත හෙමිහිට කටෙන් කඩලා දාලා අඹ ගෙඩිය කන්න පටන් ගත්තා. ගෙදර ළඟට එන කොට මුළු අඹ ගෙඩියම කාලා ඉවරයි. මම ගෙදර ඇවිත් වතුර ටිකක් එහෙම බීලා අම්මා එනකල් මඟ බලාගෙන හිටියා.



ටිකක් හවස් වෙනකොට මගේ බඩ ටික ටක රිදෙන්න ගත්තා. එන්න එන්නම බඩ රිදෙන එක වැඩි වුණා.

අම්මා හවස ගෙදර ආපු ගමන්ම මම ඒක අම්මට කිවුවා.

“මගේ පුතා නරක දෙයක් කෑවෙත් නෑනේ” අම්මා කිවුවා. අම්මා මට එක එක විදිහට හදපු බෙහෙත් වර්ග කිහිපයක්ම දුන්නා. ඒත් මගේ බඩේ කැක්කුම නම් ටිකක් වත් අඩු



වුණේම නැහැ. හවස අප්පච්චිත් ගෙදර ආවා. "මෙන්න මේ ළමයා බඩ රිදෙනවා කියලා අඬනවා" අම්මා අප්පච්චිට කිවුවා. "බෙහෙත් මොකුත් දුන්නෙ නැද්ද?" අප්පච්චි ඇහුවා. "මම හැම දෙයක්ම දුන්නා. ඒත් කිසිම අඩුවක් නෑනේ." අම්මා කිවුවා.

“එහෙනම් තවත් කල් බලා ඉඳලා වැඩක් නැහැ. අපි ඩොක්ටර් ළඟට එක්ක යමු.” අප්පච්චි අම්මාට කිවුවා.

අම්මා ඉක්මනට මාව ඩොක්ටර් ළඟට ගෙනියන්න සූදානම් කළා.

ඩොක්ටර් අංකල් ළඟ මම වාඩි උනාම අම්මා හැම දෙයක්ම එයාට කිවුවා. ඩොක්ටර් මගේ බඩ අතගාලා බලලා “දූව මොනවා හරි නරක දෙයක් කෑවා ද?” මගෙන් ඇහුවා. මම

අම්මාගෙයි අප්පච්චිගෙයි මුහුණු දිහා මාරුවෙන් මාරුවට බැලුවා. "කියන්න දුව" ඩොක්ටර් අංකල් ආයෙත් කිවුවා.

"මම අද ඉස්කෝලේ ඇරිලා එන කොට පාරේ වැටිලා තිබුණ අඹ ගෙඩියක් අහුලලා කෑවා" මම ඩොක්ටර් අංකල්ට කිවුවා.

"හා... ඒක තමයි මේ බඩේ කැක්කුම." ඩොක්ටර් අංකල් අම්මගේ මූණ දිහා බලලා කිවුවා. "අඹ ගෙඩිය හෝදලා නෙවෙයි ද කෑවේ?" ඩොක්ටර් අංකල් ඇහුවා. "නෑ.. මම

ගවුමෙන් පිහදාලා කැවේ” මම කිවුවා. “හොඳ ළමයි එහෙම කරන්නේ නෑ නේ...” ඩොක්ටර් අංකල් කිවුවා.

“ඉස්කෝලෙදි කියලා දීලා තියෙනවා නේද බිම වැටිලා තියෙන දේවල් හෝදන්නේ නැතිව කන්න එපා කියලා” ඩොක්ටර් අංකල් මගෙන් ඇහුවා. ඊට පස්සේ එයා බෙහෙත් වර්ග කිහිපයක්ම දුන්නා.

ඒවාත් අරගෙන අපි ගෙදර ආවා. ඊට පස්සෙ අම්මා ඩොක්ටර්

අංකල් දීපු බෙහෙත් මට දුන්නා. මම හරිම අමාරුවෙන් දීපු බෙහෙත් ටික ඔක්කෝම බිවුවා. කොහොමහරි පහුවදා මට ඉස්කෝලේ යන්ටත් බැරි වුණා.

"ආයේ කවදාවත් බිම වැටුණු දෙයක් හොඳට හෝදන්නේ නැතිව නං කන්න එපා මගේ පුතේ" අප්පච්චි මට කිවුවා. "සත්තු විදලා තියෙනවා නං ඒවා කන්නේ නෑ" අම්මත් කිවුවා. මම හැමෝම කියාපු උපදෙස් හොඳට අහගෙන හිටියා.

“ආයේ නං කවදාවත් බිම වැටිලා තියෙන දෙයක් හෝදන්නේ නැතිව කන්නේ නෑ” මම හිතා ගත්තා.

ඔයාලත් කවදාවත්ම බිම වැටුණු පළතුරු වගේ දේවල් හෝදන්නේ නැතිව නං කන්න එපා.

නිමි...

# සුභාශිංසන පණිවුඩය

වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමාගමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂ්‍යයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ

පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යාතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටු කළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද, දියවඩන නිළමෙ තුමන් ඇතුලු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමි.

සෙනෙවිරත්න මහලේකම්

(ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN 978_624_211_068_4